# ස්වයං අධ්‍යයනට අත්වැලක්

ශ්‍රේණිය - 8

වාරය - 3 වාරය

නිපුණතා මට්ටම - 6.2 වෙනත් සංස්කෘති වලට අයත් නර්තන අංග වල අනන්‍යතා ලක්ෂණ ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම - 6.2 භරත නාට්‍යම් හඳුනා ගනිමු.




සැකසුම :- අයි.එම්.පි.සි.කේ.රණසිංහ.

මප/වත්/හුරීකඩුව බාලිකා විද්‍යාලය



මෙහෙයවීම - නර්තන අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය

වත්තේගම

## උපදෙස්

මෙය ලිඛිත පාඩමකි.මෙම පාඩම වැඩි දුරටත් අධ්‍යයනය සඳහා පාසලේ ගුරු ඇසුර ලබාගත යුතුය.

## හැඳින්වීම

6,7 ශ්‍රේණි වලදී දේශීය නර්තන සම්ප්‍රදායන් පිළිබඳව අප ඉගෙන ගත්තෙමු.එමෙන්ම දේශීය නර්තන සම්ප්‍රදායන්ට අමතරව විදේශීය නර්තන සම්ප්‍රදායන් පිළිබඳව හඳුනා ගැනීමද ඉතා වැදගත් වේ. විදේශීය නර්තන හඳුනාගැනීමේදී භාරතීය නර්තන සම්ප්‍රදායන් පිළිබඳව අවධානය යොමු කරමු.

භාරතීය නර්තනයේ නර්තන සම්ප්‍රදායන් රාශියක් ඇති අතර එහි ප්‍රචලිතව පවතින භරත නාට්‍යම් සම්ප්‍රදායට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි.

මේ පාඩමෙන් අප සූදානම් වන්නේ භරත නාට්‍යම් සම්ප්‍රදාය

- ප්‍රචලිත ප්‍රදේශ
- ආගමික පසුබිම
- සංගීත සම්ප්‍රදාය හා භාවිත කරන වාද්‍ය භාණ්ඩ
- නර්තන උගන්වනු ලබන ආයතන
- ප්‍රවර්ධනයට දායක වූවන්
- නර්තන අංග හා රංග වස්ත්‍රාභරණ

ආදිය පිළිබඳව විස්තරාත්මක අවබෝධයක් ලබා ගැනීමටය.

# භරත නාට්‍යම් යනු,

- දක්ෂිණ භාරතයේ ප්‍රධාන ශාස්ත්‍රීය නෘත්‍ය භරත නාට්‍යම් වේ.
- භරතමුණි ගේ “නාට්‍ය ශාස්ත්‍රය” නම් කෘතිය මෙම සම්ප්‍රදායට මූලාශ්‍රය වූ බව කියැවේ.
- භාව,රාග ,තාල යන වචන තුනේ මුල් අක්ෂර ගෙන මෙම නර්තනය භරත ලෙස හඳුන්වන ලද බව කියැවේ.
- විශේෂයෙන් කාන්තාවන් උදෙසා නිර්මාණය වී ඇති භරත නාට්‍යම් පුරුෂ පක්ෂයද රග දක්වනු ලබයි.



## ප්‍රචලිත ප්‍රදේශ



- ආන්ද්‍රා ප්‍රදේශය
- තාන්ජෝරය
- මදුරාසිය

## ආගමික පසුබිම



මෙහි ආරම්භය හින්දු ආගමික පසුබිමෙහිලා සිදුවිය.ශිව දෙවියන් සමග මෙන්ම හින්දු ආගමික පූජාවිධි සමග සම්බන්ධ වේ.

දෙවියන්ට පූජාවක් ලෙස කෝවිල් අභ්‍යන්තරයෙහි මෙම නර්තනය දාසි ආට්ටම් නමින් අතීතයේ කාන්තාවන් විසින් රග දක්වන ලදී.එම කාන්තාවන් හැදින්වූයේ දෙවියන් වෙනුවෙන්ම කැපවූ දේවදාසීන් නමිනි.

# සංගීත සම්ප්‍රදාය සහ වාද්‍ය භාණ්ඩ

දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතය භරත නාට්‍යම් සඳහා භාවිතා කරයි.

- මෙහි ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වන්නේ නට්ටුවාංගම්ය.නට්ටුවාංගම් ලෙස හඳුන්වනු ලබන්නේ තාලම්පට ය.



- ප්‍රධාන අවනද්ධ භාණ්ඩය මෘදංගය වේ.



මීට අමතරව

- වීණාව
- වයලීනය
- බටනලාව
- තාම්පුරාව ආදී වාද්‍ය භාණ්ඩ භාවිත කරනු ලබයි.



වීණාව



වයලීනය



බටනලාව



තාම්පුරාව

- භරත නාට්‍යම් ගුරුවරයා විසින් නට්ටුවාංගම් වාදනය කරයි.ඔහු නට්ටුවනාර් ලෙස හැඳින්වේ.
- නට්ටුවනාර් විසින් ගයනු ලබන පද කොටස් හෙවත් ගී පද සොල්ලුකුත්තු ලෙස හැඳින්වේ.
- නට්ටුවනාර් යනු නැටුම් ගැයුම් වැයුම් යන අංගයන්හි දැනුමැති ගුරුවරයා යි.නැටුම් ඉගැන්වීම,ගායනා කිරීම,නර්තන නිර්මාණය කිරීම ආදිය පිළිබඳව මනා දැනුමක් මොහු සතුවිය යුතුය.
- භරත නාට්‍යම් සංගීත ශිල්පීන් මුත්තුකාරන් ලෙස හැඳින්වේ.
- තෙළිඟු,ද්‍රවිඩ හා සංස්කෘත භාෂා වලින් ලියන ලද ගීත ගායනා කරනු ලැබේ.
- භරත නාට්‍යම් සඳහා මහාභාරතය ,රාමායණය,රාම චන්ද්‍ර වර්ණනා,ගීත ගෝවින්දය ආදී ග්‍රන්ථ වල ඇතුළත් කතා පුවත් යොදාගනී.

## උගන්වනු ලබන ආයතනය

භරත නාට්‍යම් උගන්වන ප්‍රධාන ආයතනය වන්නේ අඩයාර් හි කලා ක්ෂේත්‍ර පදනමයි.



# භරත නාට්‍යම් සම්ප්‍රදාය ප්‍රවර්ධනයට දායක වූවන්

## තාන්ජාවුර් සහෝදරයන්

තන්ජෝරයේ පණ්ඩනාලූර් පෙළපතට අයත් චින්නයියා පොන්නයියා ශිවනාදන් හා වඩිවේලු යන සිව් දෙනා තන්ජෝර් සහෝදරයන් ලෙස හැදින්වේ.

**වර්තමාන** භරත නාට්‍යම් සංදර්ශනයක දැකිය හැකි නර්තන අංග **අනුපිළිවෙළකට මෙම ගුරුවරුන් විසින් සකසන ලදී.**

**තන්ජෝර් සහෝදරයන්ගේ කැපවීම මත** භරත නාට්‍යම් සම්ප්‍රදාය සංවර්ධනය විය.


චින්නයියා


පොන්නයියා


ශිවනාදන්


වඩිවේලු

මීට අමතරව

- රුක්මනී දේවි අරුන්ඩේල්
- ශ්‍රී මීනාක්ෂි සුන්දරම් පිල්ලෙයි
- බාල සරස්වතී
- ශ්‍රීමතී ශාන්තා
- අමිලා දේවි

යන අය මෙම නර්තනයෙහි දක්ෂ ශිල්පියෝ වූහ.

පසු කලෙක භරත නාට්‍යම් ප්‍රවර්ධනයට පුරෝගාමීන් ලෙසද මොවුන් කටයුතු කළහ.

දාසි ආට්ටම් නමින් හැඳින්වූ මෙම නර්තන සම්ප්‍රදායට භරත නාට්‍යම් නමින් වඩාත් අගයක් කිරීමට ශ්‍රී මීනාක්ෂි සුන්දරම් පිල්ලෙයි සමත් විය.



රුක්මනී දේවි අරුන්ඩේල්



ශ්‍රී මීනාක්ෂි සුන්දරම් පිල්ලෙයි



බාල සරස්වතී



ශ්‍රීමතී ශාන්තා

- භරත නාට්‍යම් හි මූලික ඉරියව්ව අරමණ්ඩිය නමින් හැඳින්වේ.

මූලික සරඹ අඩවු ලෙස හැඳින්වේ.



භරත නාට්‍යම් හී කළඑළි මංගල්‍යය අරංගේත්‍රම් ලෙස හඳුන්වයි.




**මෙය නර්තන අංග 07 කින් සමන්විත වූ සංදර්ශනයකි.**

# රංග වස්ත්‍රාභරණ

| | |
|---|---|
| සූරිය පිරෙයි | හිසට පළඳිනු ලබයි |
| චන්ද්‍ර පිරෙයි | හිසට පළඳිනු ලබයි |
| රාක්කඩි | හිසට පළඳිනු ලබයි |
| නේත්‍ර පට්ටම් | නළලට පළඳී |
| උච්චි පට්ටම් | නළලට පළඳී |
| මූකුත්ති | නහයට පළඳිනු ලබයි |
| බිලාක්ක | නහයට පළඳිනු ලබයි |
| නත්ත | නහයට පළඳිනු ලබයි |
| තෝඩු | කනට පළඳිනු ලබයි |
| මාට්ටල් | කනට පළඳිනු ලබයි |
| ජිමික්ක | කනට පළඳිනු ලබයි |
| අට්ටියල් | ගෙලට පළඳිනු ලබයි |
| පදක්කම් | ගෙලට පළඳිනු ලබයි |
| කාසිමාලෛ | ගෙලට පළඳිනු ලබයි |
| ඔට්ටියානම් | ඉණට පළඳිනු ලබයි |
| සලංගෛ | පාදටයට පළඳිනු ලබන ගෙජ්ජි |



හරත නාට්‍යම් නර්තන ශිල්පිනිය ගේ ඇඳුම් කට්ටලය
කොණ්ඩා හා මලච්චරම
මෝදිරම
රාක්කුඩි
සූර්යපුරෙයි හා චන්ද්‍රපුරෙයි
වලයෙල්
උච්පට්ටම
මූක්කුත්ති හා නත්තුපිලාක්කු
මට්ටල්
ජිමික්කි
මුත්තුමාල
වංගි
පදක්කම්මාලෙයි
ගැච්චය
ඔට්ටියානම
තුයියාසේලය
පිජාමා
විසිරි
සලංගෙයි